•ඔන්න guys මේක තමයි pdf එක.සරලව කෙටියෙන්ම කිව්වොත් ඕනම trader කෙනෙක්ව මේක ගැන නොදන්නවනම් ලේසියෙන්ම loss කරවන්න සහ නැති කරලම දාන්න පුලුවන් මාතෘකාවක් මේක.

•ඒ වගේම මොන strategy එක ඉගෙනගෙන තිබුනත් මේ pdf එකෙන් කතස් කරන මාතෘකාව ගැන දැනුමක් නැත්තන් එයා loss වෙනවා. කොච්චර කොහොම දක්ශයෙක් උනත් අනිවාර්යෙන් loss වෙනවම තමයි.

•ඒක නිසා මේ pdf එක හරියට අවදානෙන් කියවන්න.කිසිම දෙයක් මග ඇරගන්න එපා.පොඩි දෙයක් ඔයාලට miss උනොත් ඒක ලොකු අපරාදයක් වෙයි. ඒක නිසා හරියට අවදානෙන් මේ ගැන බලන්න.මේක මුල ඉඳන් අගට හරියට study කරන්න.

•එහෙනම් බලමු මෙච්චරටම මේ ලොකුවට කතා කරන මාතෘකාව මොකද්ද කියලා. මේ තමයි LIQUIDITY කියන මාතෘකාව.මේ ගැන හරියට දැනගෙන ගියොත් හොඳයි.නැත්තන් අනාතයි.

## LIQUIDITY

•Liquidity කියල කියන්නෙ market එකේ orders වැටිල තියෙන තැන් වලට.එහෙම නැත්තන් Traders ලගෙ SLs දාල තියෙන්නෙත් මේ වගේ තැන් වල.

•එතකොට Trade වල දාල තියෙන SLs hit කරගෙන market එක move වෙලා traders ලව loss කරන එකට අපි කියනවා Liquidity grab කරා කියලා.එහෙම නැත්තන් liquidity ගත්තා කියල කියනවා.

•ඒ විදියට liquidity ගන්න තැන් අපි අඳුරගෙන ඉන්න ඕනෙ වෙනවා.ඒ කිව්වෙ market එකේ liquidity තියෙන තැන් අපි දැනගෙන ඉන්න ඕනෙ වෙනවා.අපි ඒව හරියටම අඳුර්ගන්න ඕනෙ.ඒක නිසා අපි බලමු market එකේ liquidity තියෙන තැන් මොනවද කියල සහ අපි ඒව අඳුරගන්නෙ කොහොමද කියලා.එහෙම තැන් පහක් ගැන අපි බලමු.

1) Higher High & Higher Low
2)Lower High & Lower Low
3)Support & Resistance
4)Trendlines
5)Candle High & Low

දැන් අපි මේ මාතෘකා එකින් එක අරගෙන සරලව පැහැදිලිව ඉගෙනගමු මොනවද මේ කියල සහ කොහොමද මේව වැඩ කරන්නෙ කියලා.

# Higher High & Higher Low

## •Higher High Liquidity

•මේ Higher High Liquidity ගන්න market එක run වෙනව කියන්නෙ market එක buy side තියෙනව කියන එක.ඒ කිව්වෙ market එක up trend එකක තියෙන්නෙ.මෙතනදි වෙන්නෙ Market එක හදල තියෙන Higher High එක Break කරගෙන Candle එකක wick එකක් යන එක.ඒ කිව්වෙ හරියට candle එකකින් HH එක break කරන්නෙ නැතුව candle එකක wick එකකින් HH එක පහු කරල ගිහින් අයෙත් එන එකට.Traders ල HH බලල එයාලගෙ trades වල SLs තියල තියෙනව.එතකොට ඒ SL hit කරන්න market එක run වෙනව.ඒක ඇත්ත movement එක නෙවෙයි.fake movement එකකින් SL hit කරල අයෙත් market එක හරියට run වෙනවා.




•Higher low Liquidity

•මේ Higher Low Liquidity ගන්න market එක run වෙනව කියන්නෙ market එක buy side තියෙනව කියන එක.ඒ කිව්වෙ market එක up trend එකක තියෙන්නෙ.මෙතනදි වෙන්නෙ Market එක හදල තියෙන Higher Low එක Break කරගෙන Candle එකක wick එකක් යන එක.ඒ කිව්වෙ හරියට candle එකකින් HL එක break කරන්නෙ නැතුව candle එකක

wick එකකින් HL එක පහු කරල ගිහින් අයෙත් එන එකට.Traders ල HL බලල එයාලගෙ trades වල SLs තියල තියෙනව.එතකොට ඒ SL hit කරන්න market එක run වෙනව.ඒක ඇත්ත movement එක නෙවෙයි.fake movement එකකින් SL hit කරල අයෙත් market එක හරියට run වෙනවා.



## Lower High & Lower Low

### •Lower High Liquidity

•මේ Lower High Liquidity ගන්න market එක run වෙනව කියන්නෙ market එක down side තියෙනව කියන එක.ඒ කිව්වෙ market එක sell trend එකක තියෙන්නෙ.මෙතනදි වෙන්නෙ Market එක හදල තියෙන Lower High එක Break කරගෙන Candle එකක wick එකක් යන එක.ඒ කිව්වෙ හරියට candle එකකින් LH එක break කරන්නෙ නැතුව candle එකක wick එකකින් LH එක පහු කරල ගිහින් අයෙත් එන එකට.Traders ල LH බලල එයාලගෙ trades වල SLs තියල තියෙනව.එතකොට ඒ SL hit කරන්න market එක run වෙනව.ඒක ඇත්ත movement එක නෙවෙයි.fake movement එකකින් SL hit කරල අයෙත් market එක හරියට run වෙනවා.




•Lower Low Liquidity

•මේ Lower Low Liquidity ගන්න market එක run වෙනව කියන්නෙ market එක down side තියෙනව කියන එක.ඒ කිව්වෙ market එක sell trend එකක තියෙන්නෙ.මෙතනදි වෙන්නෙ Market එක හදල තියෙන Lower High එක Break කරගෙන Candle එකක wick එකක් යන එක.ඒ කිව්වෙ හරියට candle එකකින් LL එක break කරන්නෙ නැතුව candle එකක

wick එකකින් LL එක පහු කරල ගිහින් අයෙත් එන එකට.Traders ල LL බලල එයාලගෙ trades වල SLs තියල තියෙනව.එතකොට ඒ SL hit කරන්න market එක run වෙනව.ඒක ඇත්ත movement එක නෙවෙයි.fake movement එකකින් SL hit කරල අයෙත් market එක හරියට run වෙනවා.



•Support and Resistance


•trade කරන්න එන හැමෝම මුලින්ම ඉගෙනගන්න දෙයක් තමයි support සහ resistance කියල කියන්නේ. එතකොට මේ support සහ resistance වල liquidity කියන දේ ගැන ගොඩක් අය දැනුවත් නෑ.දැන් අපි බලමු support සහ resistance වල liquidity කතන්දරේ මොකද්ද කියලා.

• තුන් පාරක් tuch කරන විදියට හරස් අතට අඳින lines වලට අපි කියනවා support එකක් හෝ resistance එකක් කියලා.
•මෙතනදි support සහ resistance කියන්නෙ දෙකක්.

•Support:- support එකක් කියල කියන්නෙ market එක තියෙන තැන ඉඳන් පහලින් තිරස් අතට ඇඳල තියෙන lines වලට.

•Resistance:- Resistance එකක් කියල කියන්නෙ market එක තියෙන තැන ඉඳන් ඉහලින් තිරස් අතට ඇදල තියෙන lines වලට.

•මෙතනදි අපි lines වෙනුවට zones විදියට තමයි අඳින්නේ. ඒක analys එකට සහ entries ගන්න ලේසි කරනව අපිට.



Support zone



Resistance zone

•මෙතනදි support එකක් break කරගෙන market එක පහලට ගියොත් ඒ zone එකට අපි ඊලඟට කියන්නෙ resistance zone එකක් කියලා.ඒ වගේම resistance zone එකක් break කරගෙන market එක up උනොත් අපි ඒ zone එකට කියන්නෙ support zone එකක් කියලා.




Resistance Becomes Support



Support Becomes Resistance

•මෙතනදි support සහ resistance zones වල liquidity ගන්න market එක යනවා.එතකොට මේ support සහ resistance zones break කරගෙන දිගටම market එක move වෙනවා.



•මේ උඩ තියෙන්නෙ market එක support zone එකක liquidity ගන්න විදිය.support zone එක break කරගෙන එකදිගට sell වෙනව ඔයාලට බලාගන්න පුලුවන්.



•මේ උඩ තියෙන්නෙ market එක resistance zone එකක liquidity ගන්න විදිය.resistance zone එක break කරගෙන එකදිගට buy වෙනව ඔයාලට බලාගන්න පුලුවන්.

•ඉතින් ඔය විදියට තමයි support සහ resistance zones වල liquidity ගන්න market එක run වෙන්නේ.

# Trend Lines

•අපි trend line එකක් අඳින්නෙ points 3ක් tuch උනාට පස්සෙ.ඒත් normally අපිට පුලුවන් points 2ක් tuch උනාට පස්සෙ trendline එක අඳින්න.market එක run වෙන side එකට තමයි අපි මේ trend lines අඳින්නේ.

•මේ පහලින් තියෙන්නෙ up trend එකක යන market එකක trendline එක අඳින විදිය.




•මේ පහලින් තියෙන්නෙ down trend එකක යන market එකක trendline එක අඳින විදිය.



•market එක trend line වලට respect කරනව ගොඩක් වෙලාවට.ඒ කිව්වෙ market එක trendline එක දිගේ run වෙන වෙලාවල් ගොඩක් තියෙනවා. එතකොට මේ trendline වල liquidity ගන්න market එක run වෙනව කියන්නෙ මේ trend lines break කරගෙන market එක දිගටම එයාගෙ movement එක ගන්න එකට.


•දැන් අපි බලමු market එක කොහොමද trend line වල liquidity ගන්නෙ කියලා.

•මේ පහලින් මම දාල තියෙන image එකේ තියෙන්නෙ up trend එකක තියෙන market එකක් කොහොමද liquidity ගන්න පහලට යන්නෙ කියලා.



•බොහෝ දුරට market එක liquidity අරගන්න මෙහෙම run වෙනවා.සමහර වෙලාවට liquidity අරගෙන ආපහු trend එකට එනවා.

•මේ පහලින් මම දාල තියෙන image එකේ තියෙන්නෙ down trend එකක තියෙන market එකක් කොහොමද liquidity ගන්න පහලට යන්නෙ කියලා.



•බොහෝ දුරට market එක liquidity අරගන්න මෙහෙම run වෙනවා.සමහර වෙලාවට liquidity අරගෙන ආපහු trend එකට එනවා.


## Candle High And Low

•Candle එකක High සහ low කියල දෙකක් තියෙනවා. ඒක මම ඔයාලට පලවෙනි pdf එකෙන් කියල දීල තියෙනවා.ඒ වගේම open සහ close කියල දෙකකුත් තියෙනව candle එකේ. ඒ දේවල් මම කියල දීල තියෙනව මුල ඉඳන්ම පලවෙනි pdf එකේදි.


•මෙතනදි අපි candles වල liquidity ගැන කතා කරනකොට විශේෂයෙන්ම liquidity ගන්න යන candles තමයි Monthly,weekly සහ daily candles කියල කියන්නේ.

•අනිත් time frames වල candles වලත් liquidity තියෙනව උනාට වැඩි වශයෙන් අපි liquidity බලන්න use කරන්නෙ මම මේ උඩින් කියල තියෙන candles තුනේ තමයි.

•දැන් අපි උදාහරනෙකින්ම බලමුකො.
එතකොට ඔයාලට තේරෙයි මම මොකද්ද කිව්වෙ කියලා.




•මේ තියෙන්නේ daily candle එකක liquidity අරගෙන තියෙන විදිය.මෙතනදි කලින් candle එකේ low එක break කරල wick එකක් විතරක් පහලට හදල liquidity අරගෙන ආපහු market එක buy වෙලා තියෙනවා.




මේ තියෙන්නෙ ඒ daily candles දෙක පොඩි timeframe එකකට දැම්මට පස්සෙ අපිට බලාගන්න පුලුවන් වෙන විදිය. ඔයාලට පේනව ඇති එකම range එකක market එක run වෙලා තියෙනවා. ඒත් සමහර තැන්වලින් පහලට ඇවිල්ල ආපහු උඩට ගිහින් තියෙනවා. ඒ තමයි අර daily candle එකේ wick එකෙන් liquidity ගත්ත විදිය අපිට පොඩි timeframe එකකින් පේන විදිය.

•ICT සහ SMC trader කෙනෙක් විදියට අනිවාර්යයෙන්ම ඔයාල liquidity ගැන හොඳ දැනුමක් තියෙන්න ඕනෙ. Trade කරන්න කලින් හොඳට මේ liquidity ගැන අධ්‍යනය කරල ඉන්න ඕනෙ. ඊට පස්සෙ තමයි entries ගන්න ඕනෙ.නැත්තන් loss වෙන්න තියෙන සම්භාවිතාව ටිකක් වැඩියි.

• ඉතින් guys ඔන්න ඔහොම තමයි අපිට market එකේ liquidity ගැන දැනගන්න තියෙන්නෙ. මම හිතනවා ඔයාලට මේ ගැන හොඳට තේරුම් යන්න ඇති කියලා.තවත් හොඳට දැනගන්න ඕනෙනම් මේ pdf එකට අදාල video එක බලන්න.

All rights reserved©.
ORGA AUKLAND (PVT) LTD